# රාජ්‍ය පරිපාලන තන්ත්‍රය තුළ මැති ඇමැතිවරුන්ගේ තත්ත්වය හා ක්‍රියාකාරිත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**ආර්. එම්. ජී. වසන්ත දිසානායක**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,ඉතිහාස අධ්‍යයන අංශය, සමාජීයවිද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය.

**Abstract**

The role of the king is important to upgrade the position of a state, and also the same important position goes to the ministers of that state. The ministers have important position in the state just like the position of the king as they regulate the administrative process of the state. In the political context of history the ministers were enrolled for the administration by the king. The ruler selects ministers for the administration after enquiring the characteristics and qualities of them. In the current political context ministers are elected from a people's election as well as the cabinet is appointed by president or premier as he wishes. This study is a theoretical approach that very much important for past and present political contexts. And also the study focuses to investigate the fields that should be paid attention when the ministers are elected to a state, what are the positions they have had in administration of history and number of ministers etc.

*Key Word*: state, administrative, political context, ministers.

## හැඳින්වීම

රාජාණ්ඩු, සමූහාණ්ඩු සහිත පාලන ක්‍රියාවලියක් තුළදී මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී පාලන තන්ත්‍රයක දී ද මැති ඇමැතිවරුන්ට හිමි වනුයේ සුවිශේෂිත වැදගත්කමකි. ඉහත සඳහන් කළ කවර මාදිලියේ පාලන තන්ත්‍රයක දී වුව ප්‍රධාන පාලකයාට හෝ පාලක කණ්ඩායමට පමණක් රාජ්‍යයක පාලන තන්ත්‍රය ඉතා විධිමත් ලෙසින් සිදු කිරීම අපහසු ය. එසේ හෙයින් සිය පාලන තන්ත්‍රය පහසු කරලීම සඳහා ප්‍රධාන රජු, පාලක කණ්ඩායම හෝ විධායකය විසින් තෝරාපත් කරගනු ලබන ප්‍රධාන නිලධර කණ්ඩායම

වනුයේ අමාත්‍ය මණ්ඩලයයි. අමාත්‍ය මණ්ඩලයට පරිබාහිරව රාජ්‍ය තන්ත්‍රය තුළ මන්ත්‍රී මණ්ඩලයක් ද නියෝජනය වේ. මැති ඇමැතිවරු දෙපිරිස ම පාලන තන්ත්‍රයට විවිධාකාරයෙන් දායකත්වය සපයන බැවින් ඔවුන් තෝරාපත්කර ගැනීමේදී පාලකයා මෙන්ම පොදු ජනයා ද දැඩි අවධානයක් යොමු කළ යුතුව ඇත. අතීතයේ මෙන්ම නූතන පාලන ක්‍රියාවලියට ද එකසේ වැදගත් වන මැති ඇමැතිවරුන්ට පරිපාලන තන්ත්‍රය තුළ හිමි වූ වැදගත්කම හා ඔවුන්ගේ ගති ලක්ෂණ, දේශපාලන ලෝකය තුළ ඔවුන්ගේ කාර්‍යභාරය, මැති ඇමැතිවරු හා පාලකයා අතර වූ සබඳතා මෙන්ම රාජ්‍යයක් තුළ සංඛ්‍යාත්මකව අමාත්‍ය මණ්ඩලය කොතෙක් නිරූපණය විය යුතු ද යනාදි ක්ෂේත්‍ර ප්‍රාථමික මූලාශ්‍රය ඇසුරෙන් විමර්ශනයට ලක් කෙරේ.

### දේශපාලන ලෝකය තුළ මැති ඇමැතිවරුන්ගේ තත්ත්වය හා ඔවුන්ගේ ගති ලක්ෂණ

නූතන ප්‍රජාතන්ත්‍ර පාලන ක්‍රමවේදයක පාලන තන්ත්‍රයට සක්‍රීය ලෙස සිය දායකත්වය සපයන කැබිනට් අමාත්‍ය මණ්ඩලය හා සමාන අමාත්‍ය මණ්ඩලයක් පැරණි රාජාණ්ඩු හා සමූහාණ්ඩු පාලන තන්ත්‍රයන් තුළ ද ක්‍රියාත්මක වුණි. වර්තමානයේදී කැබිනට් මණ්ඩලයට ඇමැතිවරු තෝරාපත් කරගන්නේ ජනතා ඡන්දයෙන් පාර්ලිමේන්තුවට තෝරාපත්වන මන්ත්‍රීවරු අතරින් ය. අතීත පාලන තන්ත්‍රය තුළ ඇමැතිවරු තෝරාපත් කරගත්තේ පාලකයාගේ අභිමතය පරිදි ය. පාලකයා සිය අභිමතය පරිදි පාලන තන්ත්‍රයට ඇමැතිවරු තෝරාපත් කරගැනීමේදී ඔවුන්ගේ කුසලතා, ගති ස්වභාවයන් මෙන්ම ඔවුන් තුළ වූ විවිධාකාර වූ ගුණාංගයන් කෙරෙහි ද අවධානය යොමු කරමින් තෝරා පත්කර ගැනීම සිදු කර තිබේ. අමාත්‍ය මණ්ඩලයට පුද්ගල චරිත තෝරා ගැනීමේදී අවධානය යොමු කළ යුතු පැතිකඩ කවරේද යන්න ඉන්දීය සාහිත්‍යය මූලාශ්‍රය ඇසුරෙන් කරුණු රැසක් අනාවරණය කරගත හැකිය.

කරත්තයක් ඉදිරියට ගමන් කරන්නේ රෝද දෙකක ආධාරයෙනි. එය එක් රෝදයකින් ඉදිරියට ගමන් කරන්නේ නැත. කරත්තයේ ගමන රෝද දෙකේ සහාය මත ඉදිරියට යන්නේ යම්සේ ද රාජ්‍යය නමැති කරත්තය ඉදිරියට යනුයේ රජ හා අමාත්‍ය මණ්ඩලය නමැති රෝද දෙකෙහි සබඳතාව මත ය. ඉදින් එක් රෝදයකට කරත්තය රැගෙන යාමට නොහැකි වනුයේ යම්සේ ද එයාකාරයෙන් රාජ්‍යය නමැති ආයතනය රජුට පමණක් ඉදිරියට රැගෙන යා නොහැකිය. රාජ්‍ය නමැති කරත්තය බාධාවකින් තොරව ඉදිරියට රැගෙන යාමට නම් රජු, අමාත්‍ය මණ්ඩලය නමැති ශක්තිමත් රෝදය හොඳින් යොදාගත යුතු ය ''සහායසාධ්‍යං රාජත්වං චක්‍රමෙකං න වර්තතෙ - කුර්වීතසචිවාංස්තස්මාත්තෙෂාං ච ශෘණුයාන්මතම්'' (අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003: අධිකරණ 1, අධ්‍යාය 7. ශ්ලෝක 9). යනාදි වශයෙන් කෞටිල්‍ය දක්වන අදහස්වලින් ඉහත සඳහන් කළ කරුණු මැනවින් තහවුරු කරගත හැකිය. මෙහි සඳහන් අනෙක් වැදගත් කරුණ වනුයේ තමන් විසින් තෝරා පත්කරගන්නා ඇමැතිවරුන්ට ඇහුම්කම් දෙමින් පාලන කටයුතු සිද්ධ කළ යුතු බව පෙන්වා දීමයි. විවිධ සුදුසුකම් සහිත චරිත ඇමැතිවරු වශයෙන් තෝරා පත්කර ගනුයේ ම විවිධ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ඔවුන්ගෙන් උපදෙස් ලබා ගනිමින් රාජ්‍ය තන්ත්‍රය මෙහෙය වීම සඳහා ය. ඉදින් පාලකයා තම අභිමතයට පමණක් නොව අමාත්‍ය මණ්ඩලයේ ද උපදෙස් හා අනුශාසනාවන්ට ද අවධානය යොමු කරමින් පාලන තන්ත්‍රය මෙහෙය විය යුතු ය. මෙවැනි පාලන තන්ත්‍රය වඩාත් ශක්තිමත් මෙන්ම කාර්යක්ෂම පාලන ක්‍රමවේදයක් බව කෞටිල්‍යගේ අදහස් දැක්වීමෙන් තහවුරු කරගත හැකිය.

අමාත්‍ය මණ්ඩලය හා රජු අතර වූ සබඳතා පිළිබඳව තව දුරටත් කරුණු දක්වන කෞටිල්‍ය, අමාත්‍ය මණ්ඩලය නියෝජනය කිරීම සඳහා එම තනතුර දැරීම සඳහා සුදුසුකම් සපුරා ඇති පිරිස් තෝරාගත යුතු යැයි අවධාරණය කර තිබේ. රාජ්‍ය පාලන ක්‍රියාවලියේදී මොවුන්ගේ කාර්යභාරය අතිශයින් වැදගත් වන බැවින් පාලන ක්‍රියාවලිය ශක්තිමත් කරගැනීම සඳහා රජු දුෂ්කරම අවස්ථාවන්හී දී ඇමැතිවරු කැඳවා, ඔවුන්ගේ අදහස් විමසා බැලිය යුතු ය. එහිදී අමාත්‍ය මණ්ඩලයේ වැඩි දෙනාගේ අදහස්වලට ඇහුම්කම් දී වැඩි දෙනාගේ තීරණයට අනුව පාලකයා කටයුතු කළ යුතු බව කෞටිල්‍යගේ අදහසයි (අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003ඃ අධිකරණ 1, අධ්‍යාය 15. ශ්ලෝක 54 - 59). කෞටිල්‍යගේ මෙම ඉගැන්වීම්වලට අනුව පැහැදිලි වනුයේ හුදෙක් පාලකයෙකුට පමණක් රාජ්‍යයක පාලන කටයුතු මෙහෙය විය නොහැකි බව ය. ඔහු අනිවාර්යයෙන් ම සිය පාලන කාර්යය සඳහා ඇමැතිවරු පිරිසක් පත්කරගත යුතු ය. එසේ නැතහොත් ඔහුගේ පාලනය චක්‍රයන්ගේ සහායක් නොලද කරත්තයක් මෙන් ඉදිරියට ගමන් ගමන් කරන්නේ නැත. රාජ්‍ය තන්ත්‍රය හා සම්බන්ධ වන මන්ත්‍රීවරු පාලකයන්ගේ අසහාය බලය ලෙසින් සැලකිය හැකි යැයි **හිතෝපදේශයේ** සඳහන් වන්නේ ද මේ කරුණමයි. ''....රාඥාං මන්ත්‍රී පරං බලම්'' (හිතෝපදේශය, (මිත්‍රලාභය), 1993ඃ, ශ්ලෝක 196)

අමාත්‍ය මණ්ඩලය තෝරා පත්කර ගැනීමේදී ක්‍රියාකළ යුතු ආකාරය සම්බන්ධයෙන් **මනුස්මෘතියේ** ඇති අදහස් ද වැදගත්කමින් අනූන වේ. එහි සඳහන් වන ආකාරයට සිය අමාත්‍ය මණ්ඩලයට කිසියම් අයෙකු තෝරා පත්කර ගන්නේ නම් පාලකයා ඔවුන්ව තනි තනිව හමු වී රාජ්‍යයට හිත පිණිස හේතුවන කරුණු සම්බන්ධයෙන් ඔවුන්ගේ අදහස් විමසා බැලිය යුතු ය. එසේ විමසා බලා ඔවුන්ගේ අදහස් සැලකිල්ලට ගෙන, 'සන්ධි, විග්‍රහ' ආදි පාලන ක්‍රමවේදයන් 'ගුණ, ස්ථාන, සමුදය' ආදි වශයෙන් සැලකිල්ලට ගෙන, තමාගේ මෙන්ම රාජ්‍යයේ ආරක්ෂාවත්, යහපතත් උදෙසා කරුණු ක්‍රියාවට නැංවිය යුතු බව මනුගේ අදහසයි (මනුස්මෘතිය සහ මානවශිෂ්ටාචාරය, 2001ඃ සත්වන අදියර. ශ්ලෝක 56, 57). **මනුස්මෘතියේ** එන ඉගැන්වීම්වලින් පැහැදිලි වනුයේ අමාත්‍යවරු තෝරා පත්කර ගැනීමේදී ඔවුන්ගෙන් රාජ්‍යයේ ආරක්ෂාවටත් පාලනයේ යහපතටත් කවරාකාර උපදෙස් ලැබෙන්නේ ද යන්න අවධානය යොමු කළ යුතු බව ය. **අර්ථශාස්ත්‍රය** මෙන්ම **මනුස්මෘතිය** යන මූලාශ්‍රය ද්විත්වය ම පාලන ක්‍රියාවලියේදී අමාත්‍ය මණ්ඩලයේ අදහස් සැලකිල්ලට බඳුන් කළ යුතු යැයි අවධාරණය කර තිබේ. එයින් පැහැදිලි වනුයේ පාලකයාගේ අභිමතය පරිදි පමණක් ක්‍රියාත්මක පාලන තන්ත්‍රයට වඩා පාලක හා අමාත්‍ය මණ්ඩල යන දෙපක්ෂයේ අදහස් මත ගොඩනැගෙන පාලන තන්ත්‍රය වඩාත් ශක්තිමත් පදනමක පිහිටා ඇති බව ය. 'කටයුතු නමැති මහ මහුදෙහි ගිලෙමින් තෙරක් සොයාගත නොහැකිව පසුවෙන රජුට එතෙර වීම සඳහා ඉවුරක් පෙන්වා අත දෙනුයේ නුවණැති අමාත්‍යවරුන්ම ය.' මෙයින් පැහැදිලි කරනුයේ අමාත්‍ය මණ්ඩලයට නුවණැති අය පත්කර ගත යුතු බව ය. එසේ කළ කල්හී ඔවුන් දෙපක්ෂයට ම රාජ්‍ය කටයුතු නමැති මහමහුදෙන් ඉවුරකට සේන්දුවිය හැකිය (හිතෝපදේශ සන්නය, (විග්‍රහ කොටස), 1884ඃ ශ්ලෝක 3. පි. 156). මෙම මූලාශ්‍රය විස්තරයන්ගෙන් පැරණි දේශපාලන ලෝකය තුළ අමාත්‍ය මණ්ඩලයට කවරාකාර තත්ත්වයක් හිමිව තිබුණේ ද යන්න අවබෝධ කරගත හැකිය.

**අමාත්‍යවරු සතු කුසලතා, ගති ලක්ෂණ හා ගුණාංග**

**ප්‍රධාන අමාත්‍යවරයා හෙවත් අගමැතිවරයා**

පාලන තන්ත්‍රය තුළ පාලකයාට පසුව ස්ථරගතව සිටින ප්‍රධාන නිලය වන ප්‍රධාන අමාත්‍යවරයා හෙවත් අගමැතිවරයා තෝරා පත්කර ගැනීමේදී කවර කුලයක් එසේත් නොමැති නම් කවර වංශයක් නියෝජනය කරමින් තෝරා පත්කර ගැනීම සිදු කළේ ද යන්න පළමුව විමසා බැලිය යුතු ය. මේ පිළිබඳව අවධානය යොමු කරන හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමියන් පෙන්වා දෙනුයේ අතීත ඉන්දියාවේ පාලකයන් වන 'අජාසත්ත, විඩූඩභ, වත්සරාජ උදයන, මෞර්‍ය චන්ද්‍රගුප්ත, ධර්මාශෝක, අවන්තිපාලක චණ්ඩපජ්ජෝත, අංශුමාන් රජ, කෝසලරාජ පරන්තප, පංචාල බ්‍රහ්මදත්ත' ආදි පාලකයන් විසින් පිළිවෙලින් 'සුනීධ වස්සකාර, 'දීඝකාරායන, යෞගන්ධරායණ, චාණක්‍ය, රාධගුප්ත, 'ආචාර්‍ය පිශුන, භරත රෝහක', සෝමමුඛ, කර්ණිකභාරද්වාජ, ආචාර්‍ය බාභ්‍රව්‍ය' ආදි වශයෙන් බ්‍රාහ්මණ වංශයට අයත් තැනැත්තන් ප්‍රධාන අමාත්‍ය තනතුරට පත්කරගෙන ඇති බව ය (පඤ්ඤාකිත්ති හිමි, 2001: 18). මෙයින් පැමිණිය හැකි නිගමනය වනුයේ ප්‍රධාන අමාත්‍ය හෙවත් අගමැති තනතුර සඳහා බ්‍රාහ්මණ වංශිකයන් අතුරෙන් හැකියාවන්ගෙන් පිරිපුන් අයෙක් තෝරාගන්නට ඇති බව ය. පඤ්ඤාකිත්ති හිමියන් පෙන්වා දී ඇති කරුණ තහවුරු කරන අදහසක් **මනුස්මෘතියේ** සඳහන්ව ඇත. එහි සඳහන්ව ඇත්තේ 'හතක් අටක් වූ ඇමැතිවරු අතුරෙන් එක් බ්‍රාහ්මණයෙකු ප්‍රධාන ඇමැති බවට පත් කළ යුතු බව ය (මනුස්මෘතිය සහ මානව ශිෂ්ටාචාරය, 2001: සත්වන අදියර. ශ්ලෝක 58, 59). සීමා සහිත වූ අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානත්වය බ්‍රාහ්මණ වංශික අයෙකුට පැවරූ බව මෙයින් ගම්‍ය වේ. පැරණි භාරතයේ පැවැති සමාජ සන්දර්භයට අනුව සියලු වර්ණ ධර්ම අතර බ්‍රාහ්මණ වංශිකයන් ප්‍රමුඛ වූ බැවින් අමාත්‍ය මණ්ඩලයට හා පරිපාලන නිලධාරීන්ට මෙන්ම සමස්ත සමාජයට ම පිළිගත හැකි අයෙකු ඉහත තනතුරට බඳවා ගැනීමට ක්ෂත්‍රියයන් අවධානය යොමු කරන්නට ඇතැයි කල්පනා කළ හැකි නමුත් පැරණි භාරතීය දේශපාලන ක්ෂේත්‍රය තුළ පුරෝහිත තනතුරට මෙන්ම ප්‍රධාන ඇමැති පදවියට බ්‍රාහ්මණ වංශිකයන් ම පත්කර ගත යුතු යැයි නීතියක් හෝ සම්ප්‍රදායක් තිබුණු බවක් දක්නට ලැබෙන්නේ නැත.

අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියාට එසේත් නොවේ නම් ප්‍රධාන අමාත්‍යවරයාට (අගමැතිවරයා) අතීත දේශපාලන සන්දර්භය තුළ වැදගත් තැනක් හිමිව තිබූ බව පැරණි භාරතීය මූලාශ්‍රයෙන් කරුණු අනාවරණය කරගත හැකිය. අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානත්වය උසුලන ප්‍රධාන අමාත්‍යවරයා කවරාකාර ගති ලක්ෂණ හා ගුණාංගයන්ගෙන් සමලංකෘත විය යුතු ද යන්න අවධානය යොමු කරන **මහාභාරතය,** ''රූපවර්ණස්වරොපෙතස්තිතික්ෂුරනසූයකඃ - කුලීනඃ ශීලසම්පන්නඃ ස තෙ ස්‍යාත් ප්‍රත්‍යනන්තරඃ'' ''මෙධාවී ස්මෘතිමාන් දක්ෂඃ ප්‍රකෘත්‍යා චානෘශංස්‍යවාන් - යො මානිතොමානිතො වා නච දූෂෙයත් කදාචන'' ''කීර්ති ප්‍රධානො යස්තු ස්‍යාද් යශ්ච ස්‍යාත් සමයෙ ස්ථිතඃ - සමර්ථාන් යශ්ච න ද්වෙෂ්ටි නානර්ථාන් කුරුතෙ ච යඃ'' ''යොන කාමාද් භයාල්ලොභාත් ක්‍රොධාද් වා ධර්මමුත්සෘජෙත් - දක්ෂඃ පර්‍යාප්ත වචනඃ ස තෙ ස්‍යාත් ප්‍රත්‍යනන්තරඃ'' (මහාභාරතය, (ශාන්ති පර්වය), (වර්ෂයක් සඳහන් නොවේ) අධ්‍යාය 81. ශ්ලෝක 21 - 27) යනාදි වශයෙන් ප්‍රධාන අමාත්‍යවරයාට සියලු දෙනාගේ මන බන්ධන මනා රූසපුවක් තිබිය යුතු යැයි අවධාරණය කර තිබේ. ඊට අමතරව ඔහු වර්ණවත් මිහිරි වදන් කථා කරන, ඉවසන සුළු, ඊර්ෂ්‍යා රහිත තැනැත්තෙක් විය යුතු ය.

ඒ කියනු ලබන චරිත ලක්‍ෂණවලට අමතරව ඔහු සියලු දෙනාට පිළිගත හැකි උතුම් කුලයක උපන් තැනැත්තෙක් වීම අතිශයින් වැදගත් ය. ඒ කියනු ලබන තත්ත්වයන්ට අමතරව ඔහු තුළ ශීලවන්ත බව මෙන්ම ඥාණවන්ත බවත් ස්මරණ ශක්තියක් තිබිය යුතු යැයි අවධාරණය කර තිබේ.

ඉහත සඳහන් කළ කරුණුවලට අමතරව යම්කිසි කාර්‍යයක් කිරීමට දක්‍ෂතා දක්වන, ස්වභාවයෙන් ම දයාවන්ත වූ ද, බහුමානයේදී මෙන්ම නින්දාවේදී ද සිතෙහි ද්වේෂයක් හෝ නරක අදහස් ඇති කර නොගන්නා, කීර්තිය ප්‍රධාන කොට සලකන, අවස්ථාවට අනුව ක්‍රියා කරන, බලවතුන්ට ද්වේෂය හා අයහපත නොකරන, ඉච්ඡාවන්ට බිය වන, ලෝභයට හා ක්‍රෝධයට වසඟ වී ධර්‍මය අත් නොහරින, කථාවට චතුර වූ පටුත්වයක් ඇති කිසියම් අයෙක් වේ නම් ඔහු රාජ්‍යයේ අගමැතිවරයා ලෙස හෙවත් ප්‍රධාන අමාත්‍යවරයා ලෙසින් තෝරාගත යුතු යැයි **මහාභාරතයේ** සඳහන්ව ඇත. ප්‍රධාන ඇමැතිවරයා හෙවත් අගමැතිවරයා සතු ගති ලක්‍ෂණ පිළිබඳව තව දුරටත් කරුණු දක්වන **මහාභාරතය** 'කිසියම් මන්ත්‍රිවරයෙක් කාම, ලෝභ, බිය හා ක්‍රෝධයෙන් වසඟයට ගොස් ධර්මය පරිත්‍යාග නොකරයි නම්, යමෙක් සියලු කාර්‍යවල දක්‍ෂ හා යථාර්ථවාදී වේ නම්, ඔහු රජුගේ මුඛ්‍ය හෙවත් ප්‍රධාන මන්ත්‍රීවරයා බවට පත්කර ගත යුතු යැයි අවධාරණය කර ඇත (මහාභාරතය, (ශාන්ති පර්වය, 1 කොටස), 2006: අධ්‍යාය 81. පි. 230). **මහාභාරතයට** අනුව ප්‍රධාන ඇමැතිවරයා පත්කර ගැනීමේදී ඔහුගේ කුසලතා, මනෝමය හා බාහිර සාධක මෙන්ම විවිධාකාර වූ ගති ලක්‍ෂණ හා ගුණාංගයන් කෙරෙහි ද අවධානය යොමු කළ යුතු ආකාරයක් දැකගත හැකිය.

ප්‍රධාන ඇමැතිවරයා කවරාකාර විය යුතු දැයි කරුණු දක්වවන **අර්ථශාස්ත්‍රය** 'සිය ජනපදයේ උපන්, කුලීන, දුර්ගුණවලින් තොර, ශිල්පදත්, අර්‍ථශාස්ත්‍රයේ උගත්, බුද්ධිමත්, ස්මෘතිමත්, චතුර කථාවේ දක්‍ෂ, හුරුබුහුටි, ප්‍රතිභාපූර්‍ණ, උත්සාහවත්, ප්‍රභාවශීලි, කෙලෙස් ඉවසීමෙහි අසමත්, පිවිතුරු, මිත්‍ර ගුණවලින් යුක්ත, දෘඪ, භක්තිවත්, සිල්වත්, බලයෙන් යුත්, නීරෝගි බව හා ධෛර්‍ය සම්පන්න, අහංකාර හා චපල බවෙන් තොර, ප්‍රියශීලි, වෛරයෙන් තොර' පුද්ගලයා අගමැතිවරයා ලෙසින් පත්කර ගත යුතු යැයි අවධාරණය කරයි (අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003: අධිකාර 1. අධ්‍යාය 9. ශ්ලෝක 1). කෞටිල්‍යට අනුව ප්‍රධාන අමාත්‍ය ධූරයට පත්කර ගත යුතු වන්නේ සිය දේශයේ උපන් අයෙකු ය. දේශජ හැඟීමකින් බැහැර වූවෙකු කිසි විටෙක් රාජ්‍යයක් ඉහළට ඔසවා තබන්නේ නැත. ඔහුගේ මෙම ඉගැන්වීම් දේශපාලන ලෝකයට සර්වකාලීන අගයකින් යුතු වන අතර අගමැතිවරයා හෙවත් ප්‍රධාන ඇමැතිවරයා යනු හුදෙක් තවත් නාමික පුද්ගල චරිතයක් නොවන බව මෙයින් තව දුටත් පැහැදිලි කරයි. **අර්ථශාස්ත්‍රයේ** සඳහන්ව ඇති ආකාරයට ප්‍රධාන ඇමැතිවරයා යනු රාජ්‍යයක සමස්තය පිළිබඳව අවබෝධයක් සහිත, සියලු දක්‍ෂතාවලින් මෙන්ම කුසලතාවන්ගෙන් ද පිරිපුන් අයෙකු විය යුතු ය.

සංස්කෘත උපදේශන සාහිත්‍යයට අනුව ප්‍රධාන අමාත්‍ය තනතුර පිරිනැමිය යුතු වන්නේ සිය රටෙහි උපන් තැනැත්තෙකුට ය. ඉන් පරිබාහිර අයෙකුට එවැනි තනතුරක් භාර නොදිය යුතු ය. මේ කියනු ලබන කරුණට අමතරව කුල පරම්පරාවෙන් පැමිණි, මනා පැවැත්මෙන් යුතු, ධර්මාදිය පරීක්‍ෂා කිරීමෙන් කරන ලද පිරිසිදු අදහස් ඇති, ශාස්ත්‍රය දත්, දූ කෙළි, මත්පැම් බීම් ආදියෙහි නො ඇළුනා වූ ද, අන්‍ය අඹුවන් කෙරෙහි නොයන එවැනි දෝෂ සහගත තත්ත්වයන් නැති, මැනවින් හදාරණ ලද විවාද ආදි වූ ශාස්ත්‍ර දත්, ලෝකයා පිළිගත් නාමයක් සහිත ප්‍රසිද්ධ වංශයක උපන්, රාජනීතියට

අනුකූල වන පරිද්දෙන් ධනය වර්ධනය කරන්නා වූ පණ්ඩිතයෙක් ම (උගත් අයෙක් ම) රජු විසින් ප්‍රධාන ඇමැතියෙක් බවට පත් කළ යුතු ය.

''සවදෙශජං කුලාචාරෙ විශුඬමුපධාශුචිම් - ශාස්ත්‍රඥමව්‍යසනිනං ව්‍යභිචාරවිවර්ජිතම්

අධීතව්‍යවහාරඥං ඛ්‍යාතං මෞලං විපශචිතම් - අර්ථස්‍යොත්පාදකං සම්‍යඞ්නිදධ්‍යානමනත්‍රිණං නෘපඃ'' (හිතෝපදේශ සන්නය, (විග්‍රහ කොටස), 1884ඃ ශ්ලෝක 1. පි. 123) මේ අදහස් **අර්ථශාස්ත්‍රයේ** එන අදහස්වලට බෙහෙවින් සමාන වන බව පෙනේ.

**සෙසු අමාත්‍යවරු සම්බන්ධ මූලාශ්‍රයාගත තොරතුරු**

ප්‍රධාන අමාත්‍යවරයා හැරුණු කොට අමාත්‍ය මණ්ඩලය නියෝජනය කිරීමට සුදුසුකම් සපුරණ පුද්ගල චරිත කවර ගති ලක්‍ෂණවලින් සමන්විත විය යුතු ද යන්න පෙන්වා දෙන භාරතීය මූලාශ්‍රය 'සාමාජික ව්‍යවස්ථාවට මූලිකත්වය දෙන, කාර්‍යයන්ට අනුරූපව ත්‍යාග ජීවිතයක් ගත කරන, උගත්, චින්තනශීලි' (මනුස්මෘතිය සහ මානව ශිෂ්ටාචාරය, 2001ඃ සත්වන අදියර. ශ්ලෝක 58, 59) තැනැත්තන් ඇමැති පදවියට තෝරාගත යුතු යැයි සඳහන් කර තිබේ. රාජ්‍යාරක්‍ෂාවත්, මනා ව්‍යවස්ථාවක් පවත්වාගෙන යාම සඳහා යමෙකුට ගුණවත් පුද්ගලයන් අවශ්‍ය වන බැවින් කාර්‍යයන්ට අනුකූලව 'උත්සාහවන්ත, අලසකමෙන් තොර, කාර්‍යයෙහි දක්‍ෂ' තැනැත්තන් ඇමැතිවරු (මනුස්මෘතිය සහ මානව ශිෂ්ටාචාරය, 2001ඃ සත්වන අදියර. ශ්ලෝක 61) ලෙසින් පත් කරගත යුතු යැයි එහි වැඩි දුරටත් සඳහන් කර තිබේ. මෙවැනි ගති ලක්‍ෂණවලින් පිරිපුන් තැනැත්තන් පිළිබඳව පූර්ණ විශ්වාසයෙන් යුතුව කටයුතු පවරාදිය හැකි යැයි පෙන්වා දෙන මනු, ඉදින් රාජ්‍යයේ යහපත සඳහා කාර්‍යයෙහි දක්‍ෂ, යහපත්, විශ්වාසවන්ත ඇමැති මණ්ඩලයක් පත්කර ගැනීම වඩාත් කාලෝචිත යැයි සඳහන් කර සිටී.

අමාත්‍යවරු පත්කර ගැනීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත හා අවධානය යොමු කළ යුතු කරුණු සම්බන්ධයෙන් කරුණු රැසක් **අර්ථශාස්ත්‍රය** තුළ ද අන්තර්ගතව පවතී. කෞටිල්‍ය සිය කෘතියේදී මේ සම්බන්ධයෙන් විවිධ ගුරුකුලවලට අයත් භාරතීය න්‍යායාචාර්‍යන් විසින් ඉදිරිපත් කර ඇති මතවාද කවරේද යන්න පෙන්වා දී තිබේ. එහි සඳහන් ආකාරයට ආචාර්‍ය භාරද්වාජගේ මතවාදය වනුයේ ඇමැතිවරු ලෙසින් පත්කරගත යුතු වන්නේ 'තමන් හා එකට ඉගෙන ගත් පිරිසකි'. ඔවුන්ගේ සිත්වල දක්නට ලැබෙන පිවිතුරු බව, කටයුතුවල හැකියාව, ඉගෙන ගන්නා අවධියේ සිට ම ඔවුන් පිළිබඳව දැන හැඳිනගැනීම මෙම තෝරා ගැනීමේදී වඩාත් වැදගත් වන බව භාරද්වාජගේ අදහසයි (අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003ඃ අධිකාර 1. අධ්‍යාය 8. ශ්ලෝක 1, 2). සිය මිතුරන් ඇමැතිවරු ලෙස තෝරාගැනීමේ නිර්ණායකය භාරද්වාජට අනුව විශ්වාසවන්ත බව මත තීන්දු වී ඇති බව පෙනේ. මේ සම්බන්ධයෙන් ආචාර්‍ය විශාලාක්ෂගේ අදහස භාරද්වාජට වඩා වෙනස් ය. මිතුරන් ඇමැතිවරු ලෙස පත්කරගත් කල්හී ඔවුන් ළමා අවධියේදී කෙළි දෙලෙන් පසු වූ බැවින් විවිධාකාරයේ වූ නින්දා අපවාද කළ හැකි බව ඔහුගේ අදහසයි. මිතුරන් තෝරා ගැනීම ප්‍රතික්ෂේප කරන විශාලාක්‍ෂ යමෙක් රජුගේ ගුප්ත හැසිරීමට සමානව ම හැසිරෙන්නේ නම් එබඳු අය ඇමැති තනතුරුවලට පත් කරගත යුතු යැයි පෙන්වාදී තිබේ (අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003ඃ අධිකාර 1. අධ්‍යාය 8. ශ්ලෝක 4, 5). රජු හා සමාන හැසිරීම් ඇති අය ම ඇමැතිවරු ලෙස පත්කර ගත යුතු බව ඔහුගේ ඉගැන්වීමයි. ආචාර්‍ය පරාශර, භාරද්වාජගේ හෝ විශාලාක්ෂගේ අදහස්වලට එකඟ වන බවක් දක්නට ලැබෙන්නේ නැත. ඔහුට අනුව ඉහත සඳහන් කළ දෝෂයන්ට

රජු මෙන්ම ඇමැතිවරු ද ලක්වෙන බැවින්, යමෙක් උවදුරු අවස්ථාවක සිය පණ පරදුවට තබා කටයුතු කරයි ද, එවැනි චරිත ඇත්තවුන් ඇමැතිවරු ලෙස පත්කරගත යුතු යැයි පෙන්වා දී තිබේ (අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003ඃ අධිකාර 1. අධ්‍යාය 8. ශ්ලෝක 7 - 10). පාලකයා වෙනුවෙන් සිය පණ වුව දීමට ඉදිරිපත් වන අය අමාත්‍ය මණ්ඩලයට තෝරා ගැනීමෙන් එකිනෙකා කෙරෙහි අනුරාගය වර්ධනය වන බවත් එය රාජ්‍ය පාලනයට අතිශයින් වැදගත් බවත් එයින් ප්‍රකාශ කෙරේ.

ආචාර්ය පිශුනට (නාරද) අනුව පරාශරගේ අදහස සුදුසු වූවක් නොවේ. සිය පණ දී රජු රැකීම හුදෙක් භක්තිය හා සේවය සඳහා පමණක් විය හැකිය. ඉදින් එයින් බුද්ධියේ ගුණය නොකියවෙන බැවින් බුද්ධිමත් අය ඇමැතිවරු ලෙස පත්කර ගත යුතු බව ඔහුගේ අදහසයි (අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003ඃ අධිකාර 1. අධ්‍යාය 8. ශ්ලෝක 12, 13). භක්තියට වඩා රාජ්‍ය පාලනයේදී බුද්ධිමත් බව වඩාත් වැදගත් බව පිශුනගේ අදහසයි. ආචාර්ය භීෂ්ම නාරදගේ අදහසට එකඟවන්නේ නැත. ඔහුට අනුව ඇමැති පදවිය පරම්පරාවෙන් ලැබිය යුතු දෙයකි. පරම්පරාවෙන් තත් තනතුර ලැබෙන විට ඔහුට ව්‍යවහාරය පිළිබඳව අවබෝධයක් ඇති බව ඔහුගේ අදහසයි (අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003ඃ අධිකාර 1. අධ්‍යාය 8. ශ්ලෝක 15 - 19). පරම්පරාවෙන් ඇමැති පදවිය ලැබීම වඩාත් සුදුසු බවත් එම පාරම්පරික බව රාජ්‍යපාලන ක්‍රියාවලිය පහසු කරන බවත් එයින් කියැවේ.

ආචාර්ය වාතව්‍යාධි (උද්භව) භීෂ්මගේ අදහසට එකඟතාවක් දක්වන්නේ නැත. පරම්පරාවෙන් ඇමැති පදවි පත්කළ හොත් ඔවුන් රජුගේ සියලු දෑ ගෙන, රජු මෙන් ස්වාධීනව කටයුතු කරනු ඇති බව ඔහුගේ අදහසයි. එබැවින් 'නීති ශාස්ත්‍රයේ නිපුණ, නවීන ඇමැතිවරු' පත් කරගැනීම වඩාත් උචිත බව ඔහුගේ ඉගැන්වීමයි (අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003ඃ අධිකාර 1. අධ්‍යාය 8. ශ්ලෝක 21 - 23). රාජ්‍යය පාලනය නීතිය මත පදනම්ව ඇති බැවින් නීතිය පිළිබඳ අවබෝධය ඇති අයත්, රාජ්‍යය නව දිශානතියකට රැගෙන යා හැකි නවීන අදහස් ඇති අයත් ඇමැති පදවියට පත්කර ගැනීම වඩාත් උචිත බව ඔහුගේ ඉගැන්වීමයි. ආචාර්ය බාහුදන්තී පුත්‍ර (ඉන්ද්‍ර) උද්භවගේ අදහස පිළිග න්නේ නැත. නීති ශාස්ත්‍රය දන්නේ නමුත් ඔහුට ඇමැති කටයුතුවලදී පළපුරුද්ධක් නැති නම් එයින් ඵලයක් නොවන බවත්, එබැවින් 'කුලීන, බුද්ධිමත්, පිවිතුරු හදවතක් ඇති, ශූරවීර, ස්වාමි භක්තිය ඇති' තැනැත්තෙකු ඇමැතිවරයා ලෙස පත්කළ යුතු යැයි පෙන්වා දී ඇත (අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003ඃ අධිකාර 1. අධ්‍යාය 8. ශ්ලෝක 25, 26). බාහුදන්තී පුද්ගලයාගේ කුලීනත්වයට, බුද්ධියට, පවිත්‍ර හදවතට, ශූරවීරත්වයට මෙන්ම ස්වාමි භක්තියට ප්‍රමුඛත්වය දී ඇත.

ඉහත සඳහන් කළ ආචාර්යවරුන්ගේ මතවාද පිළිබඳව අදහස් දක්වන ආචාර්ය කෞටිල්‍ය ඇමැතිවරු පත්කර ගැනීමේ දී ඔහුට පෙර සිටි ආචාර්යවරු දක්වන අදහස්වල කිසියම් සත්‍යතාවක් අඩුවැඩි වශයෙන් පවතින්නේ යැයි පෙන්වා දෙයි. කෞටිල්‍යට අනුව ඇමැතිවරු පත්කර ගැනීමේදී වඩාත් අවධානය යොමු කළ යුතු වන්නේ පුද්ගලයාගේ 'හැකියාව හා බුද්ධිය' යන දෙයංශයට බවත්, සමත්කමට අනුරූපව අමාත්‍ය අධිකාරීන් දේශය, කුලය හා ක්‍රියා අනුව බෙදා ඒ සියලු දෙනා ඇමැතිවරුන් සේ පත් කළ යුතු යැයි පෙන්වා දෙයි (අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003ඃ අධිකාර 1. අධ්‍යාය 8. ශ්ලෝක 27 - 29). රාජ්‍යයක් ඉහළට ඔසවා තැබීමට පාලන තන්ත්‍රයට සම්බන්ධ නිලධාරීන් තුළ තිබිය යුතු ප්‍රධාන සාධක වනුයේ කුසලතාවය හා බුද්ධිමත් බවයි. ඉදින් යමෙකු මේ කියනු

ලබන ලක්ෂණ දෙකෙන් ම පිරිපුන් නම් එවැනි අය සිය අමාත්‍ය මණ්ඩලයට තෝරා ගැනීම වඩාත් සුදුසු බව කෞටිල්‍යගේ ඉගැන්වීමෙන් ප්‍රත්‍යක්ෂ වේ.

මනුට අනුව නම් ඇමැතිවරයා 'වංශ පරම්පරාවෙන් ආ, ශාස්ත්‍රය දත්, ශූර, ඉලක්කයේ දක්ෂ, මනා කුලයක උපන්, සුපරීක්ෂාකාරී' අයෙකු විය යුතු ය. ''මෞලාඤ්ශාස්ත්‍රවිදඃ ශූරාංල්ලබ්ධක්‍ෂාන් කුලොද්භවාන් සචිවාන් .... ....... ප්‍රකුර්වීත පරීක්ෂිතාන්'' (මනුස්මෘතිය සහ මානවශිෂ්ටාචාරය, 2001ඃ සත්වන අදියර. ශ්ලෝක 54) ශුක්‍රට අනුව දේශය හා කාලය පිළිබඳ දත් තැනැත්තා අමාත්‍ය ධූරයට පත්කර ගත යුතු ය (ශුක්‍රනීති, 1952ඃ අධ්‍යාය 2. ශ්ලෝක 85). මනු පුද්ගලයාගේ පරම්පරාවට, කුලීන බවට හා කුසලතාවයට අවධානය යොමු කරන විට ශුක්‍ර අවධානය යොමු කර ඇත්තේ සිය දේශය පිළිබඳ අවබෝධයට හා කාලත්‍රය පිළිබඳව හෙවත් දේශයේ ඉතිහාසය, ගමන් මග පිළිබඳ අවබෝධය ඇති චරිත කෙරෙහි ය.

ඇමැති පදවිය ලැබීමට සැපිරිය යුතු සුදුසුකම් කවරේද යන්න භාරතීය න්‍යායාචාරීන් ඉදිරිපත් කරන සමස්ත අදහස්වල පොදු බවක් දක්නට නොලැබෙන නමුත් එම අදහස්වල පොදු එකඟතාවය වනුයේ 'කුලීන, විශ්වාසවන්ත, සිල්වත්, ශූර වීර, කුසලතාවන්ගෙන්' පිරිපුන් අය තත් තනතුරට පත්කර ගැනීම වඩාත් සුදුසු බව ය. ආචාර්ය මතවාද එකිනෙකට විරුද්ධ වන නමුත් ඔවුන් විසින් දක්වන සියලු ගුණාංග හා ගතිලක්ෂණ ඇමැතිවරු කෙරෙහි පිහිටීම වඩාත් කාර්යක්ෂම, සංවර්ධිත, විනය ගරුක රාජ්‍යයකට අතිශයින් පිටිවහලක් සපයනවා ඇත.

**මන්ත්‍රිවරු සතුව තිබිය යුතු ගති ලක්ෂණ හා ගුණාංග සම්බන්ධයෙන් භාරතීය මූලාශ්‍රය විග්‍රහය**

රාජ්‍ය පාලනයට අමාත්‍යවරු යම්සේ වැදගත් ද ඒ හා සමානව වැදගත් වන අනෙක් පිරිස වනුයේ මන්ත්‍රිවරු ය. රජුගේ පරිපාලන ක්‍රියාවලියේදී ඔහුට සහායවීමට හා උපදෙස් දීමට මන්ත්‍රි මණ්ඩලයක් සිටීම පෙරදිග දේශපාලන ලෝකයේ දක්නට ලැබෙන සුවිශේෂිත තත්ත්වයකි. ඉදින් තනි රෝදයකින් රියක ගමන සිදු නොවන්නේ යම්සේ ද එසේ මන්ත්‍රි පිරිස රහිතව රාජ්‍යය ද ඉදිරියට ගමන් කරන්නේ නැත. රජුගේ ආඥාව මෙන්ම පාලන තන්ත්‍රය රාජ්‍යය තුළ ක්‍රියාත්මක කිරීමේදී වැඩි කාර්යභාරයක් මන්ත්‍රි පිරිස විසින් සිදු කරන බැවින් ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය මත තත් රාජ්‍යයේ යහපත මෙන්ම අයහපත ද රඳා පවතී. එදින් ඔවුන් කිසියම් අකටයුත්තක යෙදෙන්නේ ද, ජනතා පීඩාකාරී වේද එයින් රජුත් රාජ්‍යත් නින්දාවට පත්වෙන බව න්‍යායාචාරීන්ගේ අදහසයි. එසේ හෙයින් රජු සිය මන්ත්‍රිවරු තෝරා ගැනීමේදී වඩාත් කල්පනාකාරී විය යුතු ය. මේ පිළිබඳව අවධානය යොමු කරන ශුක්‍ර 'සියලු කාර්‍ය්‍යයන් බලන්නා ප්‍රධාන මන්ත්‍රිවරයා ලෙසත්, නීති ශාස්ත්‍රයේ දක්ෂ පුද්ගලයා මන්ත්‍රිවරයකු ලෙසත් පත්කර ගත යුතු යැයි සඳහන් කර ඇත (ශුක්‍රනීති, 1952ඃ අධ්‍යාය 2. ශ්ලෝක 83, 84). ඉහත මූලාශ්‍රය විග්‍රහයට අනුව මන්ත්‍රිවරයෙකු ලෙස තෝරාපත්කර ගැනීමේදී ඔවුන්ගේ ජන්මය පිළිබඳව පමණක් නොව ඔවුන් ප්‍රකට කරන ගුණාංගයන් පිළිබඳව මෙන්ම ඔහුගේ සමස්ත හැකියාවන් පිළිබඳව ද අවධානය යොමු කළ යුතු බව පැහැදිලිය.

මිත්‍රයන් 'සහාර්‍ය්‍ය, භජමාන, සහජ හා කෘත්‍රිම' (මහාභාරතය, (ශාන්ති පර්වය), 2006ඃ අධ්‍යාය 81. ශ්ලෝක 3) යනුවෙන් සිවු ආකාර වන අතර සිය මන්ත්‍රි පිරිස ද ඒ ආකාර වන බව පාලකයා විසින් අවබෝධ කරගත යුතු බව **මහාභාරතයේ** සඳහන් වෙයි. 'භජමාන

හා සහජ' යන මිත්‍රයන් ශ්‍රේෂ්ඨ වන අතර 'සභාජාපී හා කෘත්‍රිම' යන මිත්‍රයන්ගෙන් සඳා සැක සහිත බව ඇති වේ. මේ පිළිබඳව මනා අවබෝධයකින් පසුවිය යුතු පාලකයා සියල්ලට වඩා ධර්මය ආත්මය කරගත් මන්ත්‍රීවරු ඇසුරු කළ යුතු යැයි ඉගැන්වේ. එබඳු ගුණ ඇති මන්ත්‍රීවරයා කිසිවෙකුටත් පක්ෂපාති වන්නේ නැත. දෙපක්ෂයෙන් වේතනය ගැනීමේ කැමැත්තෙන් කපටිකම් නොකරයි. ඔහු පක්ෂපාති වනුයේ ධර්මයට පමණි. මෙවැනි ගුණ සහිත මන්ත්‍රීවරු සිය පරිපාලන තන්ත්‍රයට බඳවාගැනීමට පාලකයා උත්සුක විය යුතු බව මෙයින් පැහැදිලි කෙරේ.

**මහාභාරතයට** අනුව මන්ත්‍රීවරයා 'කළගුණ දත්, බුද්ධිමත්, උසස් කුලයක උපන්, දැඩි භක්තිය ඇති, ජිතේන්ද්‍රිය, ධර්මිෂ්ඨ හා නීතිය දත්' (මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), 2006: අධ්‍යාය 68. පි. 198) අයෙකු විය යුතු ය. හිතවත්කම්වලට ප්‍රමුඛත්වය නොදී මන්ත්‍රීවරු තෝරා ගැනීමේදී ඔවුන්ගේ බුද්ධිමත් බවට, දක්ෂකමට, භක්තියට, කෘතඥ බවට, ධර්මිෂ්ඨ බවට මෙන්ම නීතියේ ප්‍රාගුණ්‍ය බවට ප්‍රමුඛත්වය දිය යුතු බව මෙයින් අවධාරිත ය. **මහාභාරතයට** අනුව මන්ත්‍රීවරයා සතුව තිබිය යුතු ගුණාංග හා කුසලතා හතෙන් හයක් ම ඔහු විසින් උපයාගත යුතු තත්ත්වයන් ය. උසස් කුලයක උපන් බව යනු ඔහුට උපතින් ලැබෙන තත්ත්වයකි. ඉදින් එවැනි තත්ත්වයක් මන්ත්‍රීවරයාගෙන් අපේක්ෂා කරනුයේ චතුර්වර්ණය මුල් බැසගත් සමාජයේ සියල්ලන්ගේ ගෞරවයට හා පිළිගැනීමට මන්ත්‍රීවරයා ලක්විය යුතු නිසා විය හැකිය. එසේ නොවී පහත් කුලයක අයෙක් මන්ත්‍රීවරයෙකු වශයෙන් පත් කළේ නම් උසස් කුලවල අයගේ අවමානයට ලක්වීමේ ඉඩප්‍රස්තාව ද වැඩිය. එවැනි තත්ත්වයක් දේශපාලන පරිසරය තුළ ප්‍රකට වන්නේ නම් එය පාලන තන්ත්‍රයට එතරම් සුදුසු වන්නේ නැත.

ඉහත සඳහන් කළ කරුණුවලට අමතරව 'කළගුණ දත්, ශික්ෂිත, විද්වත්, ඥානවිඥාන දත්, සියලු ශාස්ත්‍රවල අර්ථය හා තත්ත්වය දත්, සහනශීලී, ස්වදේශීය, බලවත්, ඉවසන සුළු, සිත දමනය කරන ලද ජිතේන්ද්‍රිය, ලෝභ රහිත, ලද දෙයින් සතුටු වන, ස්වාමියාගේ දියුණුව මිත්‍රයා මෙන් කැමැති වන, සාකච්ඡා පිළිබඳව දත්, යම් දේශයක හෝ යම් කාලයක යම්බඳු කාර්යයක් කළ යුතු ද ඒ සියල්ල දත්, සත්ත්වයාගේ හිත ප්‍රසන්න කිරීමෙහි අනුරක්ත, සදාචාරයෙන් යුක්ත, සදා යුක්ති සහගත සිත් ඇති, හිතෛෂී, අලස බවෙන් තොර, සිය දේශයේ චරපුරුෂයන් යොදන, සන්ධි හා විග්‍රහ පිළිබඳ කාලය දත්, රජුගේ ධර්මාර්ථය හා කාමය පිළිබඳ අවබෝධය ඇති, පුර හා ජනපද වැසියන්ට ආදරය දක්වන, දිය අගල් හා බිම්ගෙවල් සෑරීමේ හා ව්‍යූහ පිළිබඳව දත්, සියලු සේනාව සතුටට පත් කිරීමෙහි නිපුණ, විවිධාකාර වූ සංකේත පිළිබඳ දැනුම ඇති, සතුරු ආක්‍රමණ හා වාහන පිළිබඳ විශාරද වූ, ඇත් ශික්ෂාවෙහි නිපුණ, අහංකාර රහිත, ප්‍රගල්භ, දානී, ධර්මාත්මා, බලවත්, උචිත කාර්ය කරන, පිවිතුරු හා පිවිතුරු අයගෙන් පිරිවැරූ, ප්‍රසන්න බවෙන් යුක්ත, සුදර්ශන, නායක, නීතිකුශල, විවිධාකාර වූ ගුණ සයකින් යුක්ත වූ, සාවධාන, විනය ගරුක, සමර්ථ, මිහිරි හා කෝමල භාෂාවෙන් යුක්ත, සෞම්‍යය, වහා ඓශ්වර්යයෙන් යුක්ත, දේශ කාල අනුව කාර්ය කරන' (මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), 2006: අධ්‍යාය 80. පිටු. 227, 228) ආදි වූ සුදුසුකම්වලින් හා ගති ලක්ෂණවලින් පිරිපුන් පුද්ගලයන් රජු විසින් මන්ත්‍රීවරු ලෙසින් පත්කර ගත යුතු ය. ඉදින් මෙවැනි ලක්ෂණ සහිත පිරිස් තත් පදවිය සඳහා පත් කර ගනී ද, කිසිවිටෙකත් ඔවුන්ට අවමන් නොකරයි ද, එවිට සඳරැස් මෙන් එම රජුගේ රාජ්‍යය ද වර්ධනය වන බව' **මහාභාරතයේ** වැඩිදුරටත් විස්තර කර තිබේ. ඉහත සඳහන් කළ මූලාශ්‍රය විස්තරයන්ට අනුව අතීත දේශපාලනය තුළ මන්ත්‍රී පදවිය පහසුවෙන් ලබාගත නොහැකි

වූවකි. සිංහාසනාරූඪවීමට කිසියම් අයෙකුට ගුණාංග හා ගති ලක්ෂණ සමුදායක් අවැසි ද එබඳු ම ආකාරයේ ගුණාංග හා ගති ලක්ෂණ මන්ත්‍රී පදවියට ද අවැසි බව මෙයින් පැහැදිලි කෙරේ.

ඉහත සඳහන් කළ කරුණුවලට අමතරව යමෙක් 'ස්මෘතියෙන් යුක්ත නම්, දක්ෂතා සහිත වූවෙක් නම්, ස්වභාවයෙන් දයාවන්ත නම්, සම්මාන හෝ අවමන් කළ විට කිසිවිටෙකත් හදවතෙහි ද්වේෂයක් ඇතිකර නොගන්නේ නම් ආචාර්‍ය්‍ය හා ඉතාමත් ප්‍රිය වූ' මිත්‍රයා මන්ත්‍රී තනතුරට පත්කර ගෙන සිය ගෘහයේ පදිංචි කරවාගත යුතු බව **මහාභාරතයේ** ඉගැන්වීමක සඳහන්ව තිබේ. මෙසේ පත්කර ගනු ලබන තැනැත්තා කෙරෙහි අධික සම්මාන කොට සිය පියා පිළිබඳව ඇති කරගත් විශ්වාසය හා සමාන විස්වාසයක් ඔහු කෙරෙහි ඇති කරගත යුතු යැයි **මහාභාරතයේ** සඳහන් තිබේ. (මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), 2006ඃ අධ්‍යාය 81. පි. 230) පුත්‍රයෙකු සිය පියා කෙරෙහි ඇති කරගන්නා විශ්වාසය හා සමාන විශ්වාසයක් සිය මන්ත්‍රීවරයා කෙරෙහි ද ඇති කර ගත යුතු බව කීමෙන්මන්ත්‍රීවරයාත් පාලකයාත් අතර රාජකාරිම ය බැඳීම කෙබඳු වී ද යන්න සිතාගත හැකිය. මන්ත්‍රීවරයා සතු ගුණාංග හා ගති ලක්ෂණ පිළිබඳව තව දුරටත් කරුණු දක්වන **මහාභාරතය** 'මහාභාග, නීති, උත්සාහවත්, සද්භාවයෙන් යුක්ත, පරස්පර අසංසෘෂ්ට, ජයග්‍රහණය කැමැති, ලෝභ රහිත, නීතියේ දක්ෂ, බුද්ධියුක්ත, ස්වාමියාට හිතවත්, උසස් සිතක් ඇති' සහායකයන් මන්ත්‍රීන් කරගත යුතු යැයි සඳහන් කරයි (මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), 2006ඃ අධ්‍යාය 112. පි. 313). **මහාභාරතයේ** එන ඉහත විස්තරකථනයන් ද්විත්වයෙන් ම අවධාරණය කර ඇත්තේ මන්ත්‍රී පදවිය සඳහා විශ්වාසවන්ත මිතුරන් පත්කර ගැනීම වඩාත් උචිත බව ය. මූලාශ්‍රය විග්‍රහයට අනුව මිතුරන් රාජ්‍ය පාලනයට යොදා ගැනීම වඩාත් උචිත වනුයේ ඔහු විශ්වාසවන්තව පාලන කටයුතුවලට දායකත්වය සපයන බැවිනි.

ඉහත පෙන්වාදුන් කරුණුවලට අමතරව යමෙක් 'ශූර, ආර්‍ය්‍ය, විද්වත්, කාර්‍ය්‍යාකාර්‍ය්‍ය ඥානයේ නිපුණ, කුලීන, උතුම් ස්වභාවයෙන් යුක්ත, ඉවසනසුළු හා නින්දාවට පත් නොවූයේ' නම් ඔහු මන්ත්‍රී පදවියට පත්කර ගැනීම වඩාත් උචිත බව (මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), 2006ඃ අධ්‍යාය 81. පිටු. 230, 231) **මහාභාරතයේ** එන විස්තරයෙන් පැහැදිලි වෙයි. මන්ත්‍රීවරයකු පත්කර ගැනීමේදී අවධානය යොමු කළ යුතු කරුණු කවරේ ද, ඔහු කවර ගති ලක්ෂණවලින් හා ගුණාංගයන්ගෙන් සමන්විත විය යුතු ද යන්න **මහාභාරතයේ** එන විවිධ පැහැදිලි කිරීම්වලින් තහවුරු වනුයේ තත් පදවිය රාජ්‍යය තුළ සැලකිලිමත්ව පිහිටු විය යුතු බව ය. ඉහත සඳහන් කළ ගති ලක්ෂණ හා ගුණාංගයන්ගෙන් සමලංකෘත මන්ත්‍රීවරයා රජුගේ සියලු කාර්‍ය්‍යවල නියුක්ත කරලීමට සුදුසුකම් සපුරයි. ඉදින් සිය මන්ත්‍රී පර්ෂදයට පාලකයාගෙන් නිසි ගෞරව සත්කාර හිමි වන්නේ නම් ඔවුන් නිතැනින් ම රජුගේ උතුම් සහායකයන් බවට පත්ව, රාජ්‍යයේ අයවැය ගණන් හිලවු ආදි සියලු කාර්‍ය්‍යවල දක්ෂ වී රජුගේ දියුණුව අපේක්ෂාවෙන් කටයුතු කරනු ඇත.

කිසියම් මන්ත්‍රී කෙනෙක් සන්ධි හා විග්‍රහා ආදි ක්‍රියාවන් නිම කිරීමෙහි දක්ෂකම් දක්වන්නේ ද, සේනාවන්ගේ හා ධනයන්ගේ සමෘද්ධිය ඇති කරන්නේද, දේශකාලයන්ගේ විවේචනය මැනිවින් සිදු කරන්නේ ද, (මේ දේශයට සුදුසු සාමයයි. මෙහිදී දීම කළ යුතු ය. දඬුවම් මේ දේශයේදී දිය යුතු ය යනාදි වශයෙන් තීරණය කරගැනීම) විපත් ප්‍රතිවිධානය කෙරේද, (තමන්ට විපත් නො පැමිණෙන සේ ක්‍රියා කිරිම) පැවරුණු

කටයුතු මැනවින් සිදු කරයි ද (කටයුතු හරිහැටි ඉෂ්ට කර ගැනීම) මෙවැනි ලක්ෂණවලින් පිරිපුන් තැනැත්තා යහපත් මන්ත්‍රීවරයෙක් ලෙසින් සැලකිය හැකි අතර එබඳු අය සිය මන්ත්‍රීවරු ලෙස පත්කර ගැනීමට අවධානය යොමු කළ යුතු බව සංස්කෘත උපදේශන සාහිත්‍යයේ නිර්දේශයයි. ''කර්මණාමාරම්භොපායඃ, පුරුෂද්‍රව්‍යසංපද්, දෙශකාලවිභාගඃ, විනිපාතප්‍රතීකාරඃ, කාර්‍යසිද්ධිශ්චෙති.'' (පඤ්චතන්ත්‍රය, (මිත්‍රභේදය), 1983ඃ පි. 84)

බුද්ධිමත් පාලකයා ඓශ්වර්‍ය කැමැති වන්නේ නම් සිය මන්ත්‍රී - සේවකයන්ගේ සියලු ගුණ පරීක්ෂා කළ යුතු ය. ඉදින් 'ආත්මීය, කුලීන, ස්වදේශීය, අල්ලස් ගැනීම් ආදියෙන් වසඟයට නොයන, ව්‍යභිචාර රහිතව මනා පරීක්ෂණයෙන් යුතුව පුද්ගලයන් සමග සබඳතා ඇති කර ගන්නා ශ්‍රේෂ්ඨ යුද භටයෙක් වූ ද, වේදය දත්, සිය උන්නතිය කැමැති වන' තැනැත්තා මන්ත්‍රී පදවියට තෝරාගත යුතු බවත්, යමෙක් කථිකයන් අතර 'සත්‍යයුක්ත, සංකේත දත්, දරුණු බවෙන් තොර, දේශ හා කාල උපාය දත්, ස්වාමියාගේ කාර්‍යයේ හිතෛෂීව කටයුතු කරයි ද' ඔවුන් ද සියලු කාර්‍යයන්හී මන්ත්‍රීන් කළ යුතු බව එහි වැඩි දුරටත් සඳහන්ව ඇත (මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), 2006ඃ අධ්‍යාය 84. පි. 241). ඉහත සඳහන් කළ ආකාරයට **මහාභාරතයේ** එන ඉගැන්වීම්වලින් ප්‍රකට වනුයේ අමාත්‍ය ධූරයට තෝරාපත් කරගනු ලබන පුද්ගලයන් හා සමානව ම මන්ත්‍රී පදවියට පත්වන තැනැත්තා කෙරෙහි ද පාලකයා වැඩි අවධානයක් යොමු කළ යුතුව ඇති බව ය. කිසියම් අයෙකු රාජපාක්ෂික වූ පමණින් මන්ත්‍රී පදවියට පත් නොකළ යුතු බවත්, ඔහු කෙරෙහි පිහිටි ගුණාංග හා දක්ෂතා ආදිය ද සැලකිල්ලට ගෙන තත් පදවියේ ස්ථාපිත කළ යුතු බවත් මෙයින් අර්ථගැන් වේ.

ඉහත සඳහන් කළ කරුණුවලට අමතරව 'වේදය පිළිබඳ මනා අවබෝධයක් ඇති, චතුර ........ ආදි ගුණ සමුදායකින් හෙබි සිවු බ්‍රාහ්මණයන් මෙන්ම, නිත්‍ය කර්මයේ ඇලුණු, පිවිතුරු, විනීත ශුද්‍රයන් තිදෙනා' යන අය ද මන්ත්‍රීවරු බවට පත්කරගත යුතු බව **මහාභාරතයේ** සඳහන්ව ඇත (මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), 2006ඃ අධ්‍යාය 86. පි. 245). මූලාශ්‍රයේ එන මෙම විස්තරයෙන් පැහැදිලි කරනුයේ මන්ත්‍රී පදවියට කුලය එතරම් වැදගත් නොවන බව ය. ඒ සඳහා ආගමික සම්ප්‍රදායෙන් ඇති කරගත් හික්මීම, පිවිතුරු බව හා වීනිත බව වැනි ගුණාංග ප්‍රමාණවත් වන බව එයින් කියැවේ.

මන්ත්‍රී පදවිය ලබාදිය යුතු වන්නේ කවර ගති ලක්ෂණ ඇත්තවුන්ට ද යන්න පැහැදිලි කරන යාඥවල්ක්‍ය ඍෂිවරයා ගුණවත් රජු 'බුද්ධිමත්, පරම්පරාවෙන් මන්ත්‍රී පදවිය හිමි, ධෛර්‍යවත්, පිවිතුරු හදවතක් ඇති අය' මන්ත්‍රී පදවියට පත් කළ යුතු යැයි සඳහන් කර ඇත (යාඥවල්ක්‍යස්මෘති, 1912ඃ ආචාරාධ්‍යාය. ශ්ලෝක 311). යාඥවල්ක්‍ය ඍෂිවරයා විසින් දක්වා ඇති අදහස් මහාභාරතයේ දක්වා ඇති අදහස්වලට සමපාත වන බවක් පෙන්නුම් කෙරේ.

කෞටිල්‍යට අනුව සිය මන්ත්‍රීවරයාගේ 'කාර්‍ය කිරීමේ බුද්ධිය, ස්මරණ ශක්තිය හා හැකියාව, වචනයේ දක්ෂ බව හා ප්‍රතිභාව, විපත් කාලයක උත්සාහය, ඉවසීමේ හැකියාව, මෛත්‍රිය මගින් හදවතේ පිවිතුරු බව, ව්‍යවහාරය මගින් දෘඪ භක්තිය, එකට වාසය කරන අය මගින් ශීලය, බලය, සැපය, ධෛර්‍යය, අභිමාන රහිත බව හා ස්ථිර ස්වභාවය, සිය අත්දැකීම් මගින් සෞම්‍ය බව, හැඩහුරුකම හා ප්‍රීතිය' ආදි වශයෙන් මන්ත්‍රීවරයාගේ ගති ලක්ෂණ හා ක්‍රියාදාමයන් විමසා බැලිය යුතු ය (අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003ඃ අධිකාර 1. අධ්‍යාය 9. ශ්ලෝක 3). මේ ආදි වශයෙන් මූලාශ්‍රයේ දැක්වෙන කරුණුවලින් පැහැදිලි

වනුයේ හුදෙක් සුදුසුකම් සම්පූර්ණ කළ පිරිස් පමණක් රාජ්‍ය සේවයේ තනතුරුවලට පත් කළ යුතු බව ය. ඉදින් ඔවුන් එම තනතුරුවල පිහිටුවීමට මත්තෙන් ඔවුන්ගේ චරිත ලක්‍ෂණ මෙන්ම ක්‍රියාකලාපයන් ද විමසා බැලීම පාලකයා සතු කාර්‍යයක් බවට පත්කර ගත යුතු ය. භාරතීය න්‍යායාචාරීන් මන්ත්‍රී ධූරයක් ලැබීම සඳහා ඔවුන් සතුව තිබිය යුතු විවිධ ගුණාංග හා හැකියාවන් කවරේ ද යන්න විවිධාකාරයෙන් වාර්තා කර ඇති නමුත් 'බුද්ධිමත් බව, කුලවත් බව, ධෛර්‍යයවත් බව, හැඩහුරුකම, විනීත බව, කාර්‍යක්‍ෂම බව, විශ්වාසවන්ත බව' ආදි ලක්‍ෂණ ඒ තුළ දක්නට ලැබෙන පොදු කරුණු ලෙස ඉස්මතු කොට දැක්විය හැකිය.

මන්ත්‍රී පදවිය ලැබීමට කවර සුදුසුකම් සපුරාලිය යුතු ද යන්න භාරතීය මූලාශ්‍රය දක්වා ඇති කරුණු ඉහත දී සාකච්ඡාවට ලක් කළ අතර එම පදවිය ලැබීමට නුසුදුසු පිරිස් කවරේ ද යන්න එම මූලාශ්‍රය ම දක්වන කරුණු ද මෙහිදී සාකච්ඡාවට ලක් කළ යුතුව ඇත. මූලාශ්‍රය විග්‍රහයට අනුව කිසියම් අයෙකු 'තේජස් රහිත, අසංතුෂ්ට මිත්‍රයකු සමඟ සබඳතා පවත්වන මන්ත්‍රීවරයා කිසි කලෙකත් කළ යුතු නොකළ යුතු දෑ නිශ්චය කිරීමට සමත්වන්නේ නැත. එවැනි තැනැත්තා සියලු කාර්‍යයන්හී සැක උපදවයි. එම නිසා ඔහු කිසිවිටෙකත් මන්ත්‍රී පදවියට පත් නොකළ යුතු ය. ශාස්ත්‍ර පිළිබඳ අල්ප ඥානය ඇති මන්ත්‍රීවරයා උතුම් කුලයක උපන්නේ නමුත් ධර්ම, අර්‍ථ හා කාමයෙන් යුක්ත නම් ඔහු ගුප්ත හෙවත් රහස් සාකච්ඡා පරීක්‍ෂා කිරීමෙහි සමත් නොවේ. නීච කුලයක උපන් තැනැත්තා මනාව බහුශ්‍රැත වූයේ නමුත් නායකයෙක් නැති සෙනිකයන් හා අන්ධයෙක් මෙන් සියුම් කටයුතුවල මෝහිත වෙයි. එසේ ම ඔහුට කළ යුතු නොකළ යුතු දෙය පිළිබඳව නිශ්චය කිරීමේ හැකියාවක් ද නැත. අස්ථිර සංකල්ප ඇති පුද්ගලයා බුද්ධිමත් ශාස්ත්‍ර දන්නේ හා උපාය දන්නෙක් වුවත් බොහෝ කාලයක් කාර්‍ය කිරීමෙහි සමත් නොවේ. ...... යම් මන්ත්‍රී කෙනෙක් රජු කෙරෙහි අනුරාගය නොමැති ද ඔහු ගැන විශ්වාස කිරීම යුක්ති යුක්ත නොවේ. එම නිසා විරක්ත (නොඇලුණු) මන්ත්‍රීවරයා සමීපයේ කිසි විටෙකත් ගුප්ත අදහස් ප්‍රකට නොකළ යුතු යි. යම්සේ ගින්නක් වෘක්‍ෂයන් සුළඟින් පිරුණු සිදුරුවලට ප්‍රවේශ වී එය අළු කර දමයි ද, එසේ ම එම කපටි මන්ත්‍රීවරයා ගුප්ත අදහස් දැන, වෙනත් මන්ත්‍රීන් හා එකතුව, රජුට දුක් දෙන්නේ යැයි ද පෙන්වා දී තිබේ.' (මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), 2006: අධ්‍යාය 84. පිටු. 241, 242) යනාදි වශයෙන් **මහාභාරතයේ** එන ඉගැන්වීම්වලින් ප්‍රකට කරනුයේ ඉහත ගති ලක්‍ෂණවලින් සමන්විත පිරිස් කිසි කලෙකත් මන්ත්‍රී ධූරයට සුදුසු නොවන බව ය. එවැනි ගති ලක්‍ෂණ ඇත්තවුන් සිය මන්ත්‍රීවරු ලෙස පත්කර ගන්නා පාලකයා ලබන අවසාන ප්‍රතිඵලය වනුයේ දුකත්, විනාශයත්, පසුතැවිල්ලත් පමණි.

සංස්කෘත උපදේශ සාහිත්‍යය තුළ ද මේ සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා කර තිබේ. 'යම් රජකෙනෙකුගේ මන්ත්‍රීවරු, දුර දක්නා නුවණක් සහිත නොවේ නම් ඒකාන්තයෙන් ඔහුගේ මෙන්ම රජුගේ පරිහානිය සිදුවන්නේ ය.' ''න දීර්ඝදර්ශිනො යස්‍ය මන්ත්‍රිණඃ ස්‍යුර්මහීපතෙඃ - ක්‍රමායාතා ධ්‍රුවං තස්‍ය න චිරාත්ස්‍යාත්පරීක්‍ෂයඃ'' (පඤ්චතන්ත්‍රය, (කාකොලූකීය), 2011: ශ්ලෝක 195) යන සඳහනින් පැහැදිලි කරනුයේ රජුගේ අභිවෘද්ධිය හෝ පරිහානිය ඔහු වටා සිටින මැති ඇමැතිවරුන්ගේ නැණවත් බව, තීන්දු තීරණ ගැනීමේ හැකියාව හා ක්‍රියාත්මක වීමේ ශක්තිය මත රඳා පවතින බව ය. පාලකයෙකුට අවශ්‍ය වන්නේ අප්‍රමාදීව කටයුතු කරන ඇමැතිවරු ය. රාජ්‍ය පරිපාලන ක්‍රියාවලියේදී ඇමැතිවරු අප්‍රමාදීව කටයුතු කරන්නේ නම් තත් රාජ්‍යය මෙන්ම පාලකයාගේ අභිවෘද්ධිය ද සිදු වෙයි. කිසියම් පාලකයෙකුගේ ඇමැතිවරු

ප්‍රමාදයෙන් යුක්ත නම් ඒ රජුගේ රාජ්‍යය විනාශයට පත්වීම කිසිවෙකුටත් නැවැත්විය නොහැකිය (පඤ්චතන්ත්‍රය, (කාකොලූකීය), 2011: ශ්ලෝක 211). මැති ඇමැතිවරු සම්බන්ධ වූ මෙබඳු අදහසක් එයාකාරයෙන් ම **හිතෝපදේශයේ** ද සඳහන්ව ඇත. එයින් ද පැහැදිලි කරනුයේ ප්‍රමාද වූ ඇමැතියන් ඇති රජුගේ රාජ්‍යය විනාශ වන බව ය. (හිතෝපදේශය, (සුහෘද්භේදය), 1996: ශ්ලෝක 108) රාජ්‍යයක අභිවෘද්ධිය පාලකයෙකුගේ උත්සහාවන්ත බව මත පමණක් තීන්දු වන්නක් නොවේ. එහි අභිවෘද්ධියට මන්ත්‍රීවරු මෙන්ම ඇමැතිවරු ද එකසේ සිය දායකත්වය සැපයිය යුතු ය. ඉදින් ඔවුන් ප්‍රමාදීන් නම්, අලසයෝ නම් තත් රාජ්‍යයේ පරිහානිය කවරෙකුට වත් නැවැත්විය නොහැකිය.

විවිධ ගුණාංග හා ගතිලක්ෂණ සහිත පිරිස් සිය මන්ත්‍රීවරු ලෙස පාලන තන්ත්‍රයට එකතු කර ගන්නේ නමුදු ඔවුන් අතර ද වෙනස්කම් නැත්තේ නොවේ. ඕනෑම රාජ්‍යයක හොඳ හා නරක මන්ත්‍රීවරු සිටී. එය ඕනෑම ක්ෂේත්‍රයක දක්නට ලැබෙන පොදු තත්ත්වයකි. කිසියම් මන්ත්‍රීවරයෙක් 'ධර්ම ශාස්ත්‍රයේ යථාර්ථවාදීව ඥානවන්ත ද, සන්ධි - විග්‍රහ පිළිබඳ විශේෂයෙන් දන්නේ ද, බුද්ධිමත් ද, ධෛර්යමත් ද, ධීමත් ද, රහස් විෂය සඟවා තබන්නේ ද, කුලීන වේ ද, සත්‍යවාදී හා පරාක්‍රමයෙන් යුක්ත වේ ද' ඔහු සියලු මන්ත්‍රීන් අතර ප්‍රශංසනීය මන්ත්‍රීවරයා වන බවත් පෙන්වා දෙයි. කිසියම් පාලකයෙකුට සතුටින් පිරුණු, පුෂ්ටිමත් මන්ත්‍රීවරයෙක් වේ නම් ඔහු සියල්ලේ මූලය ලෙස සැලකිය හැකි බවත් **මහාභාරතයේ** සඳහන් වේ (මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), 2006: අධ්‍යාය 95. පිටු. 268, 269). ඉහත සඳහන් කළ මූලාශ්‍රයට අනුව මන්ත්‍රීවරු තෝරා ගැනීමේදී ඔහු තුළ වූ කුසලතාවන් පිළිබඳව පමණක් නොව ගුණාංගයන් හා ඔහුගේ ගති ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරමින්, ගැඹුරින් නිරීක්ෂණය කොට, තෝරා ගැනීම් සිදු කළ යුතු ය.

**මැති ඇමැතිවරුන්ගේ කාර්යභාරයන් හා ඔවුන් කෙරෙහි පාලකයා දැක් වූ පිළිවෙත**

සුදුස්සන් තෝරාගෙන, සුදුසු ස්ථානයේ ස්ථාපිත කොට, සුදුසු කාර්යයන්හී නියුක්ත කොට, රාජ්‍යය ඉහළට ඔසවා තැබීම පාලකයා සතු වගකීමකි. ඉදින් තමා මත පැවරී ඇති එම වගකීම නොසලකා හරිමින් පාලකයා ඥාතිත්වයට, හිත්වත්කම්වලට, විවිධ මාදිලියේ වූ අල්ලස්වලට රාජ්‍යයේ තනතුරු පිරිනමන්නේ ද එම පාලකයාගේ රාජ්‍යයේ පරිහානියේ තීව්‍ර බව කිසිවෙකුටත් නවතාලිය නොහැකිය. එබැවින් පාලකයා හැම විටෙක ම පාහේ සුදුස්සා සුදුසු තැන තැබීමටත්, සුදුසු කාර්යයෙහි පිහිටුවීමටත් කටයුතු කළ යුතු ය. ඒ අනුව පැරණි භාරතීය දේශපාලන ක්ෂේත්‍රය තුළ මැති ඇමැතිවරුන්ට රාජ්‍යය තුළ පැවැරී තිබූ කාර්යයන් කවරේද හා ඔවුන් කෙරෙහි පාලකයාගේ පිළිවෙත කවරාකාර වී ද යන්න මෙහිදී විමසුමට ලක් වේ.

විනය ගරුක, ශීලාචාරී පාලකයා සිය රාජ්‍යය තුළ කටයුතු කරන්නේ යම්සේ ද එසේ ඔහුගේ අනුගාමිකයන් වන මැති ඇමැතිවරු ද කටයුතු කළ යුතු ය. අනුගාමිකයන් සිය කාර්යයන්හී නිවැරදිව නියුක්ත වීමට නම් පාලකයාගේ ක්‍රියාකලාපය ද ඒ සඳහා අතිශයින් බලපෑම් කරනු ලබයි. එනිසා ම රාජ්‍ය පාලනයේ දී භාරතීය න්‍යායාචාරීන් පළමුව උපදෙස් දී ඇත්තේ පාලකයන්ට ය. සිය පාලනයට සම්බන්ධ වූ 'ශක්තිසම්පන්න, චතුර, මනා කුලයක උපන්, පිවිතුරු හදක් ඇති' ඇමැතිවරුන්ට බලය දී, ධන ධාන්‍ය එකතු කරන ස්ථානවල තබා, ඔවුන්ගෙන් අවශ්‍ය කරන කාර්යයන් කරගත යුතු යැයි අවධාරණය කරන **මනුස්මෘතිය** ඉදින් කිසියම් ඇමැතිවරයෙක් බිය සුළු ගතියෙන් පෙළේ

නම් හේ අන්තඃපුර ආදි ස්ථානවල තබා කටයුතු කළ යුතු යැයි උපදෙස් දී තිබේ. (මනුෂ්මෘතිය සහ මානව ශිෂ්ටාචාරය, 2001: සත්වන අදියර. ශ්ලෝක 62) තත් මූලාශ්‍රය පෙන්වා දෙන ආකාරයට අමාත්‍ය මණ්ඩලයේ දක්ෂ හා අදක්ෂයන් තෝරා බේරාගෙන, සුදුසු ලෙස අදාළ කාර්‍ය්‍යයෙහි නියුක්ත කිරීම රජු සතු කාර්‍ය්‍යයක් බව මෙයින් පැහැදිලි කරගත හැකිය.

මන්ත්‍රී ධූරය හෝ ඇමැති ධූරය ලබන තැනැත්තාට සිය දේශය පිළිබඳව මෙන්ම තමා ජීවත්වන භූ භෞතික පරිසරය පිළිබඳව ද හසළ දැනුමක් තිබිය යුතු බව 'ගම් කොපමණ ද, කෙතරම් කැළෑ වෙයි' ද යන්න රජුට දැන්විය යුතු ය (ශුක්‍රනීති, 1952: අධ්‍යාය 2. ශ්ලෝක 102). යන ශුක්‍රගේ ඉගැන්වීමකින් ප්‍රකට වේ. රජු විසින් යොමු කරනු ලබන නිශ්චිත කාර්යභාරයන්ට අමතරව ඉහත සඳහන් කළ භූ භෞතික විස්තර, සීමා මායිම් හා සිය පාලන ප්‍රදේශයට අයත් භූමිය පිළිබඳ දැනුම ද ඔවුන් විසින් ලබා තිබිය යුතු බව මෙයින් පැහැදිලි වේ.

මැති ඇමැතිවරුන්ගේ කාර්යභාරයන් අතර ප්‍රධානත ම කාර්යභාරය වූයේ රජුට උපදෙස් දීමයි. එම උපදෙස් සිය රාජ්‍ය පාලනයට යොදා ගැනීම හෝ නොගැනීම රජු සතු වූවකි. ඉදින් මෙම උපදේශන ක්‍රියාවලියට අමතරව ඔවුන් සිය පාලන ප්‍රදේශයන්හී අධ්‍යක්ෂක තනතුරෙහි ද කටයුතු කළ ආකාරයක් දක්නට පුළුවන (පඤ්ඤාකිත්ති හිමි, 2001: 36). ඉහත සඳහන් කළ රාජකාරිවලට අමතරව 'මෙතෙක් ආරම්භ නොකළ කාර්‍ය්‍යය ආරම්භ කිරීම, ආරම්භ කළ කාර්‍ය්‍යය අවසන් කිරීම, සම්පූර්ණ කළ කාර්‍ය්‍යය වඩා වර්ධනය කිරීම, සියලු කාර්‍ය්‍ය සම්පාදනයෙහිලා සාධන එකතු කිරීම හා ඒවා යෙදවීම' (පඤ්ඤාකිත්ති හිමි, 2001: 36) වැනි කාර්‍ය්‍යයන් ද මැති ඇමැතිවරුන්ට අයත්ව තිබූ බව මෞර්‍ය්‍ය යුගයේ පරිපාලන නිලධාරීන් ඇසුරෙන් තහවුරු කරගත හැකිය.

සුදුසුකම් සපුරණ කිසියම් අයෙක් මැති ඇමැති ධූර පාලකයාගෙන් ලැබුව ද තම සේවාව රටට මෙන්ම සිය ජනයා වෙනුවෙන් යැයි නිතර කල්පනා කළ යුතු ය. එසේ පරිපාලන තන්ත්‍රයට එකතු වන මන්ත්‍රීවරු තමාගේ හා සතුරු පක්ෂයේ දුර්වලකම් හැමකල්හී ම ඉලක්ක කළ යුතු යි. මන්ත්‍රීවරුන්ගේ උතුම් සාකච්ඡා රජුගේ රටෙහි මූලය වන බැවින් එයින් රටට විශාල දියුණුවක් ලැබෙයි. ඉදින් තමාගේ සිදුරු සතුරාට දැකිය නොහැකි ද, තම සිදුරු වසා සතුරන්ගේ සිදුරු සෙවිය යුතු යි. යම්සේ කැස්බෑවන් සිය අංග සඟවා සිටියි ද, ඒ ආකාරයෙන් සිය සිදුරු සැඟවීමට කටයුතු කළ යුතු යැයි **මහාභාරතයේ** සඳහන් වෙයි (මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), 2006: අධ්‍යාය 84. පි. 243). නියම ගුණාංග හා ගති ලක්ෂණවලින් පිරිපුන් මන්ත්‍රීවරයෙකු මේ ආකාරයෙන් කටයුතු කිරීම තත් රාජ්‍යයෙහි අභිවෘද්ධිය සඳහා බෙහෙවින් වැදගත් වන බව මෙයින් පැහැදිලි වෙයි. රාජ්‍ය පාලනයේ දී මන්ත්‍රීවරු එතරම් ම වැදගත් වන බැවින් ශ්‍රේෂ්ඨ බුද්ධිමතුන් 'දූතයා රාජ්‍යයේ මූලය හා සාකච්ඡා රාජ්‍යයේ හරය යැයි පෙන්වා දෙන අතර යහපත් මන්ත්‍රීවරු සමඟ රජු ගුප්ත සාකච්ඡා කළ යුතු යැයි' (මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), 2006: අධ්‍යාය 84. පි. 243) සඳහන් කර තිබේ. මෙවැනි ගුණාංග සහිත මන්ත්‍රීවරුන්ට අමතරව වේදය පිළිබඳ හසළ දැනුමක් ඇති සිවු බ්‍රාහ්මණයන් හා නිත්‍ය කර්මයේ ඇලුණු, පිවිතුරු, විනයවාදී ශුද්‍රයන් ද මන්ත්‍රී තනතුරෙහි පිහිටුවා ඔවුන් සමඟ සාකච්ඡා කිරීම ද උචිත වන බව ඉහත මූලාශ්‍රයේ ම සඳහන් කර ඇත (මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), 2006: අධ්‍යාය 86. පි. 245). මන්ත්‍රීවරයා 'තමාගේ අඩුපාඩු සඟවාගෙන, සතුරන්ගේ අඩුපාඩු සොයා ඔහුට පහරදීමට කල්පනාකාරි විය යුතු ය'

යන්නෙන් පැහැදිලි වනුයේ පාලකයා රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධ කරුණු මෙන්ම රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රයෙහි අතිශයින් සංවේදී කරුණු, සුදුසුකම් සපුරා ඇති, ඊට අවශ්‍ය ම පිරිස් සමඟ පමණක් සාකච්ඡා කළ යුතු බව ය.

රාජ්‍ය පරිපාලනයට බඳවාගත් මැති ඇමැතිවරු රාජ්‍යයේ අපේක්ෂා උල්ලංඝනය කරමින් කටයුතු කරන්නේ නම් ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග කවරේද යන්න මූලාශ්‍රය කරුණු දක්වයි. මූලාශ්‍රය විස්තරයන්ට අනුව පරිපාලන ක්‍රියාවලියේදී මන්ත්‍රීන් වැරදි කරන්නේ නම් ඔවුන්ට රාජනීතිය අනුව දඬුවම් කොට, සේවයෙන් පහකිරීම අවශ්‍යයෙන් ම කළ යුතු ය. එසේ සේවයෙන් පහකරන මන්ත්‍රීන් පිළිබඳව හොඳ අවබෝධයක් පාලකයෙකුට තිබිය යුතු ය. කිසියම් අවස්ථාවක කෝපයට පත්වෙන රජු යමෙකු මන්ත්‍රි පදවියෙන් බැහැර කරයි ද, එසේ නොමැති නම් අසතුටට පත්ව නින්දා කොට, නැවත ඔහු කෙරෙහි පැහැදෙයි ද, එවැනි තත්ත්වයක් ඉවසිය හැකි වන්නේ සිය ස්වාමියා කෙරෙහි මැනවින් ඇලුණු මන්ත්‍රිවරයෙකුට පමණි. එවැනි කාර්යයකදී අප්‍රසාදයට පත්වෙන මන්ත්‍රිවරයාගේ ක්‍රියාකාරකම් අතිශයින් භයානක ය. අප්‍රසාදයට පත් මිනිසුන්ගේ ක්‍රෝධය වජ්‍රපාතයක් (හෙණ පුපුරන්නක්) මෙන් බියකරු ය (මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), 2006: අධ්‍යාය 84. පි. 242). යනාදි වශයෙන් මූලාශ්‍රය පෙන්වා දෙනුයේ සේවයෙන් පහකරන තැනැත්තා පිළිබඳ මනා කියවීමක් පාලකයාට තිබිය යුතු බව ය. දුෂ්ටයන්ට වරදට දඬුවම් කළ ද ඔවුන් රජු කෙරෙහි කෝප වෙයි. රජු සමඟ කෝප වූ මන්ත්‍රිවරු රජුත් රාජ්‍යයත් විනාශ කිරීමට කළ හැකි ඕනෑම දෙයක් කිරීමේ සිතුවිලිවලින් පිරිපුන් අය බව මෙයින් පැහැදිලි කෙරේ.

ඉහත සඳහන් කළ කරුණුවලට අමතරව යමෙකුගේ මන්ත්‍රීවරු දුෂ්ට හා පාපීහු වෙත් ද, යමෙක් ඔවුන්ගේ සහායෙන් ධර්මයට හානි කරයි ද, ඔහු වහා ම පවුල සහිතව දුකට පත් කොට මිනිසුන්ගේ ඉදිරියේ ඝාතනය කළ යුතු බව මූලාශ්‍රයේ සඳහන් වේ. (මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), 2006: අධ්‍යාය 93. පි. 264) මන්ත්‍රිවරු සිය ආඥාව ඉක්මවා ඔවුන්ගේ අභිමතය පරිදි ධර්මයට පරිබාහිරව ක්‍රියා කරයි ද, ඔවුන්ගේ එම ක්‍රියා නිසා ප්‍රජාව කිසියම් ආකාරයක දුකට පත්වේ ද එවැනි මන්ත්‍රිවරු තමාට, රාජ්‍යයට හා ප්‍රජාවට හානිදායක බැවින් ප්‍රජාව ඉදිරියෙහි ම ඝාතනය කිරීම වරදක් නොවන බව මහාභාරතයේ එන මෙම ඉගැන්වීම්වලින් පැහැදිලි කෙරේ.

**රාජ්‍යයක් තුළ සංඛ්‍යාත්මකව අමාත්‍ය මණ්ඩලය කොතෙක් නිරූපණය විය යුතු ද යන්න මූලාශ්‍රය විග්‍රහය**

රාජ්‍යයක අමාත්‍ය මණ්ඩලය කොතෙක් විය යුතු ද යන මාතෘකාව අතීතයේ මෙන්ම නූතන දේශපාලන සංස්ථාවන්හී ද සාකච්ඡාවට ලක් වූ හා ලක්වෙමින් පවතින වැදගත් සංසිද්ධියකි. නූතන දේශපාලන සංසිද්ධීන් විවිධ තලවල ක්‍රියාත්මක වන බැවින් නූතන දේශපාලනයට අවධානය යොමු නොකොට අතීත දේශපාලන න්‍යායාචාරීන් මේ සම්බන්ධයෙන් දැක් වූ අදහස් කවරේද යන්න විමසිය යුතු ය. මේ පිළිබඳව අදහස් දක්වන මනු අමාත්‍ය මණ්ඩලය නියෝජනය සඳහා සංඛ්‍යාත්මකව හත් දෙනෙක් හෝ අටදෙනෙක් තෝරා පත්කර ගත යුතු යැයි පෙන්වා දී තිබේ (මනුස්මෘතිය සහ මානවශිෂ්ටාචාරය, 2001: සත්වන අදියර, ශ්ලෝක 54). මනු එසේ කීව ද ඔහුගේ අනුගාමිකයන්ගේ අදහස වනුයේ ඇමැති මණ්ඩලයට දොළොස් දෙනෙකු පත්කර ගත යුතු බව ය. මීට වඩා වෙනස් අදහසක් දරන බෘහස්පති පෙන්වා දෙනුයේ අමාත්‍ය

මණ්ඩලය සඳහා දහසය දෙනෙකු පත්කර ගත යුතු බව ය. ශුක්‍රට අනුව එහි සිටිය යුතු ඇමැතිවරු ගණන විසි දෙනෙකි. ''මන්ත්‍රිපරිෂද් ද්වාදශාමාත්‍යාන්කුර්වීත ඉති මානවාඃ - ෂොඩශීති බාහස්පත්‍යාඃ විංශතිම්ඉත්‍යෞශනසාඃ'' (කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003ඃ අධිකාර 1. අධ්‍යාය 15. ශ්ලෝක 47 - 49) කෞටිල්‍යගේ අදහස ඉහත ආචාර්ය්‍ය වරුන්ට වඩා මඳක් වෙනස් වන අතර ඔහුට අනුව කාර්ය්‍ය කරන පුද්ගලයන්ගේ සංඛ්‍යාව අනුව එය තීරණය විය යුතු ය (කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003ඃ අධිකාර 1. අධ්‍යාය 15. ශ්ලෝක 50). මෞර්ය්‍ය අධිරාජ්‍යයේ පාලන තන්ත්‍රය පිළිබඳව අවධානය යොමු කරන හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමියන් පෙන්වා දෙනුයේ එකල පරිපාලන තන්ත්‍රය සඳහා මන්ත්‍රිවරු සංඛ්‍යාත්මකව දොළොස් දෙනෙකු හෝ විසි දෙනෙකු සිටි බව ය (පඤ්ඤාකිත්ති හිමි, 2001ඃ 36). ඉහත සඳහන් භාරතීය මූලාශ්‍රයට අනුව අමාත්‍ය මණ්ඩලයේ සංඛ්‍යාත්මක බවෙහි පොදු එකඟතාවක් දක්නට ලැබෙන්නේ නැත. 'අමාත්‍ය මණ්ඩලයේ සංඛ්‍යාව පිළිබඳ පූර්ව නිගමන හෝ නීති කෙටුම්පතක නොසිට කාර්ය කරන පුද්ගල අනුපාතය අනුව සංඛ්‍යාව තීරණය කළ යුතු ය' යනුවෙන් කෞටිල්‍ය දක්වන අදහස්හි කිසියම් සාධනීය බවක් ඇති බව කිව යුතු ය.

## සමාලෝචනය

රාජ්‍යයක පාලන තන්ත්‍රය මෙහෙය වීමට පාලකයෙකු යම්සේ වැදගත් ද ඒ හා සමාන වැදගත් කමක් එරට මැති ඇමැතිවරුන්ට ද හිමි වන බව කිව යුතු ය. ඉදින් එවැනි වැදගත් කමක් හිමි මැති ඇමැතිවරු තත් ධූරවලට පත්කර ගැනීමේදී අවධානය යොමු කළ යුතු කරුණු කවරේද යන්න ඉහත දී සාකච්ඡාවට බඳුන් කරන ලදි. මැති ඇමැති තනතුරු ලැබීම සඳහා සැපිරිය යුතු සුදුසුකම් කවරේද, කවර ගති ලක්ෂණ හා ගුණාංගයන්ගෙන් ඔවුන් පිරිපුන් විය යුතු ද යන්න භාරතීය මූලාශ්‍රය දක්වන සමස්ත තොරතුරුවල පොදු බවක් දක්නට නොමැති නමුත් 'දේශජත්වය, කුලීනත්වය, ශූර වීරත්ය, විශ්වාසවන්ත බව, පිවිතුරු බව, බුද්ධිමත් බව' ආදි කුසලතා මෙන්ම ගති ලක්ෂණ හා ගුණාංග පොදු අපේක්ෂා ලෙස පැවැති බව පෙන්වාදිය හැකිය. එසේම කිසියම් මැති ඇමැති කෙනෙක් විශ්වාසයෙන් බැහැරව සිය රාජ්‍යයට ද්‍රෝහි වන්නේ නම් ඔහුව තනතුරෙන් පහකර, අවසානයේ මරණයට වුව පත්කිරීම වරදක් නොවන බව තත් මූලාශ්‍රය විග්‍රහ කරයි. පර්යේෂණයේ අවසානයේ සාකච්ඡාවට ලක්වූයේ අමාත්‍ය මණ්ඩලයේ සංඛ්‍යාත්මක බවෙහි වූ විවිධත්ව යයි. දේශපාලන න්‍යායාචාරීන් අතර ඒ සම්බන්ධයෙන් පොදු එකඟතාවක් දක්නට නොමැති බවත් කෞටිල්‍ය ඒ සම්බන්ධයෙන් දක්වන අදහස්හි කිසියම් සාධනීය බවක් ඇති බවත් මෙයින් පෙන්වාදිය හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය

**අර්ථශාස්ත්‍රය,** (අධිකාර 1-2), (2003). අනු. පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ, කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

**පඤ්චතන්ත්‍රය,** (මිත්‍රභේදය), (1983). සම්පාදක. ජිනානන්ද හිමි, කෙරමිණියේ, කොළඹඃ රත්න පොත් ප්‍රකාශකයෝ.

**පඤ්චතන්ත්‍රය,** (කාකොලූකීය), (2011) සම්පාදක. මහානාම හිමි, මිනිවන්ගමුවේ, කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

**මනුස්මෘතිය සහ මානව ශිෂ්ටාචාරය,** (2001). පරි. සෙනෙවිරත්න, නාගොඩ ආරියදාස, කොළඹඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

**මහාභාරතය,** (ශාන්ති පර්වය 1 කොටස), (වර්ෂයක් සඳහන් වේ). ගෝරඛපුරඃ (ඉන්දියා) හනුමානප්‍රසාද පෝද්දර ප්‍රකාශන, මූලාශ්‍රය අන්තර්ජාලය.

**මහාභාරතය,** (ශාන්ති පර්වය 1 කොටස), (2006). පරි. පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ, කොළඹඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

**යාඥවල්ක්‍යස්මෘති,** (Yājnavalkya Smṛti), (1912). ed. S S. Setlur, Madras: (India) Brahmavadin Press.

**ශුක්‍රනීතිසාරය,** (1, 2, 3, 4), (1952). සංස්. බේමරාජ - ශ්‍රී කෘෂ්ණදාස, කතීෘ ප්‍රකාශනයකි, (ඉන්දියා)

**හිතෝපදේශ සන්නය,** (1884). පරි. සුමංගල හිමි, වැලිගම සහ ජෝර්ජ්, ජේ. ඒ. ස්කීන්, ශ්‍රී ලංකාඃ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

**හිතෝපදේශය,** (මිත්‍රලාභය), (1993). සංස්. තිලකසිරි සිරි, කොළඹඃ රත්න පොත් ප්‍රකාශකයෝ.

**හිතෝපදේශ ශ්‍රී සුමංගල අභිනව ව්‍යාඛ්‍යාව,** (සුහෘද්භේද කථා සංග්‍රහය), (1996). සංස්. සුමංගල හිමි, පහමුණේ, කොළඹඃ සමයවර්ධන මුද්‍රණකරුවෝ සහ පොත් ප්‍රකාශකයෝ.

## ද්විතීයික මූලාශ්‍රය

පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ, (2001). **පුරාතන භාරතීය පාලන මූලධර්ම**, කොළඹඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

අල්ටේකාර්, ඒ. එස්., (2004). **පැරණි ඉන්දියාවේ රාජ්‍ය සහ ආණ්ඩුව**, පරි. අබේරත්න, ඩී. ඇල්. නුගේගොඩඃ සමන් ප්‍රකාශකයෝ.